සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය- **2026** උපකාරක තක්සේරුව
General Certificate of Education (Adv. Level) Exam-**2026 Supportive Assessment**

| ජීවවිද්‍යාව I<br>Biology I | 09 | S | I | 13 ශ්‍රේණිය<br>Grade 13 | පැය දෙකයි<br>Two hour |
|---|---|---|---|---|---|

**උපදෙස්: –**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න
* පිළිතුරු පත්‍රයේ පිටුපස ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** දක්වා සෑම ප්‍රශ්නයකටම **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි අදාළ නිවැරදි අංකය මත කතිරයක් (x) යොදා දක්වන්න.

**1.** කාබොනයිල් කාණ්ඩයට අනුව මොනොසැකරයිඩ වර්ග කිරිමේදී කීටෝස් කාණ්ඩයක් අඩංගු වන සංයෝගයක් වන්නේ
(1) රයිබෝස්
(2) ග්ලිසරල්ඩිහයිඩ්
(3) ෆ්‍රක්ටෝස්
(4) එරිත්‍රෝස්
(5)ගැලැක්ටෝස්

**2.** ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂ පිළිබඳ සත්‍ය වගන්තිය වන්නේ පහත කවර ප්‍රකාශය ද?
(1) සෛලයක මතුපිට ඇති ව්‍යුහ ඉතා පැහැදිලිව නිරීක්ෂණය සඳහා සම්ප්‍රේෂණ ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂ සුදුසු වේ.
(2) *Paramecium* ගේ පක්ෂ්ම චලනය පරිලෝකන ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂය මගින් දැකගත හැකිවේ.
(3) අලෝක කිරණ නාභිගත කිරීම සඳහා ප්‍රබල විද්‍යුත් චුම්බක භාවිත කරයි.
(4) ශාක පත්‍රයක අපිචර්මීය සෛලවල මතුපිට ත්‍රිමාන පෙනුම නිරීක්ෂණය කිරීමට පරිලෝකන ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂය උපයෝගී කරගත හැකිය.
(5) 0.2nm විභේදනයක් සහිතව $5 \times 10^{5}$ වාරයක විශාලනයක් ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂ මගින් ලබාගත හැකිවේ.

**3.** ATP වැය වන ක්‍රියාවක් වනුයේ,
(1) $C_3$ ප්‍රභාසංශ්ලේෂණයේ දී OAA පුනර්ජනනය
(2) කණාමැදිරියාගේ ජෛව සංදීප්තිය
(3) සිම්ප්ලාස්ටයේ සිට ඇපොප්ලාස්ටයට ජලය පරිවහනය
(4) කාෂ්ඨීය ශාකවල සිදුවන රසෝද්ගමනය
(5) අපායනයේ දී ප්ලෝයම හර කිරීම

**4.** පිළිකා සෛල සම්බන්ධව සත්‍ය ප්‍රකාශය වනුයේ පහත කවරක් ද?
(1) සාමාන්‍යයෙන් පිළිකා සෛල ජීවී සෛල තුළ පමණක් ගුණනය වන අතර දේහ පාලන යන්ත්‍රණවලට ප්‍රතිචාර දක්වයි.
(2) මුල් ස්ථානයේ සිට දුර ස්ථානයකට පිළිකා සෛල පැතිරීම ස්ථානාන්තරණය නම් වේ.
(3) අසාමාන්‍ය සෛල මුල් ස්ථානයේම රැඳී ඇතිවන සෝපද්‍රව අර්බුදයකි.
(4) ආක්‍රමණශීලී ලෙස අවයව එකකට හෝ කීපයකට පහර දෙන අර්බුද නිරුපද්‍රව අර්බුද වේ.
(5) සෛල චක්‍රය යාමනය කරන සාමාන්‍ය සංඥාවලට පිළිකා සෛල ප්‍රතිචාර දක්වයි.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**5.** ප්‍රභාසංශ්ලේෂණයේ රේඛීය ඉලෙක්ට්‍රෝන ගලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- ජලය විච්ඡේදනයේ දී නිදහස් වන ඉලෙක්ට්‍රෝන මඟින් උද්දීපනය වූ ප්‍රභාපද්ධති II උදාසීන කරයි.
B- $NADP^+$ ඔක්සිකරණය $NADP^+$ රිඩක්ටේස් එන්සයිමය මඟින් උත්ප්‍රේරණය කරයි.
C- ප්‍රභාපොස්ෆොරයිලීකරණය යනු පහළ ශක්ති මට්ටමක සිට ඉහළ ශක්ති මට්ටමකට ඉලෙක්ට්‍රෝන පැමිණීමේදී නිදහස්වන ශක්තියෙන් ATP සංශ්ලේෂණයයි.
D- ආලෝකයේ ෆෝටෝන ප්‍රභාපද්ධති IIහි ඇති වර්ණක මත ගැටීම නිසා එහි ඇති ඉලෙක්ට්‍රෝන අධිශක්ති මට්ටමකට උද්දීපනය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ කවරක්ද?/ කවර ඒවාද?

(1)A පමණි (2)B පමණි (3) A සහ D පමණි
(4)A,B සහ D පමණි (5) A,B,C සහ D පමණි

**6.** සෛල චක්‍රයේ විවිධ පියවරවල දී වැදගත් වන ප්‍රෝටීන කිහිපයක් සහ ඒවායේ කෘත්‍යයන් කිහිපයක් පහත දී ඇත.

| ප්‍රෝටීනය | කෘත්‍යය |
|---|---|
| A- හිස්ටෝන | P-සහෝදර වර්ණදේහාංශවල වර්ණදේහ බාහු බැඳ තබා ගැනීම |
| B- කොහෙසින් | Q- වර්ණදේහ චලනයට අවශ්‍ය ක්ෂුද්‍රනාලිකා තැනීම |
| C- ටියුබියුලින් | R- DNA සමඟ ක්‍රොමැටීන් සෑදීම |
| | S-අනුනන තර්කුව සෑදීම |
| | T- වර්ණදේහ ,ක්ෂුද්‍රනාලිකාවලට සම්බන්ධ කිරීම |

සියලුම ″ ප්‍රෝටින - කෘත්‍යය″ සංකලන නිවැරදි වන වරණය තෝරන්න.

(1)A-Q, B-P, C-R (2) A-T, B-R, C-Q
(3) A-R, B-S, C-P (4) A-R, B-P, C-S
(5) A-T, B-Q, C-S

**7.** $C_3$ ශාකවල ප්‍රභාශ්වසනය පිළිබඳ සත්‍ය වන්නේ,
(1) ප්‍රභාශ්වසනය සිදුවන්නේ ද්වීපටලමය ඉන්ද්‍රියිකාවල පමණි.
(2) ශාකවල ශුද්ධ කාබන් ලාභය අඩු කිරීමට මඟ පාදන ක්‍රියාවලියකි.
(3) ප්‍රභාශ්වසනයේ ඵල ලෙස කාබන් පරමාණු තුනක් සහිත අණු පමණක් නිපදවයි.
(4) ප්‍රභාශ්වසනය ශක්තිය අවශෝෂණය ඉලක්ක කරගත් ප්‍රතික්‍රියාවකි.
(5) $C_3$ ප්‍රභාසංශ්ලේෂණ පථයේදී රුබිස්කෝ එන්සයිමය අවට $CO_2$ සාන්ද්‍රණය අඩුකර ගැනීම නිසා ප්‍රභාශ්වසනය වැළකී ඇත.

**8.** විවිධ ඇල්ගී කාණ්ඩ සහ ඒවායේ ලක්ෂණ පිළිබඳ පහත දක්වා ඇති සංකලන අතුරින් නිවැරදි වන්නේ කුමක්ද ? කුමන ඒවා ද?

| | |
|---|---|
| A- දුඹුරු ඇල්ගී | ක්ලොරොෆිල් d, ඇල්ජිනික් අම්ලය,උත්ප්ලාවක/ ඉපිල්ලා |
| B- හරිත ඇල්ගී | ක්ලොරොෆිල් b , පිෂ්ඨය, අවුල් පාසුව |
| C- රතු ඇල්ගී | ක්ලොරොෆිල් a, ෆ්ලොරිඩියන් පිෂ්ඨය, අවුල්පාසුව |
| D- ඩයටම | ක්ලොරොෆිල් c, ක්‍රයිසොලැමිනාරින්, සිලිකා බිත්තිය |

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(1) A පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) B, C සහ D පමණි. (5) A, C සහ D පමණි.

**9.** ශාක පරිණාමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

A- ඩෙවෝනීය හා කාබොනිෆෙරස් අවධිවල ශාක පරිණාමය වූ බවට සාක්ෂි ෆොසිල සහ ජීවමාන බීජ සහිත සනාල ශාක මගින් පෙන්නුම් කෙරේ.
B- සනාල ශාකවල පූර්වජයන් සතුව එකම ප්‍රමාණයේ ජන්මාණු සහ බීජාණු ශාක තිබූ බවට ෆොසිල සාක්ෂි පවතී.
C- ටෙරොෆයිටාවන්ගේ සහ ලයිකොෆයිටාවන්ගේ පොදු පූර්වජයාට වඩා මෑත කාලීන පොදු පූර්වජයෙකු ටෙරොෆයිටා හා විවෘත බීජක ශාකවලට ඇත.

(1) B පමණි. (2) C පමණි. (3) A සහ B පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C සියල්ලම.

**10.** Basidiomycota වංශයේ දැකිය නොහැකි නමුත්, Ascomycota හෝ Zygomycota වංශවල දැකිය හැකි ලක්ෂණය/ ලක්ෂණ අඩංගු සංකලනය වන්නේ කුමක්ද?

A- සංසෙලික දිලීර ජාල
B- ප්‍රමුඛ ඒකන්‍යෂ්ටික දිලීර ජාලය
C- බහිර්ජන්‍ය ලිංගික බීජාණු
D- අහිතකර පරිසර තත්ත්වවලට ප්‍රතිරෝධී ව්‍යුහ

(1) B පමණි (2) A සහ B පමණි (3) B සහ D පමණි
(4) A, B සහ C පමණි (5) A, B සහ D පමණි

**11.** ශිෂ්‍යයෙක් මුහුදු වෙරළකදී හමු වූ කරදියවාසී ජීවියෙක් විද්‍යාගාරයට ගෙන ගොස් විච්ඡේදනය කිරීමේදී පහත ලක්ෂණ නිරීක්ෂණය කළේය.

A- සම්පූර්ණ ආහාර මාර්ගය
B- උදරීයව දක්නට ලැබෙන ස්නායු රජ්ජුව
C- ඛණ්ඩනය වූ දේහය
D- සංවෘත රුධිර සංසරණ පද්ධතිය

මෙම ජීවියා අයත්විය හැකි වංශය කුමක් ද?

(1) Echinodermata (2)Annelida
(3) Arthropoda (4)Cnidaria
(5) Mollusca

**12.** භෞමික ශාක පරිණාමයේ දී ඇති වූ ව්‍යුහයන් හයක් (A-F) ලෙස පහත දක්වා ඇත.එම ව්‍යුහයන් සම්භවය වූ නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වන්නේ.

A- ස්වාධීන බීජාණු ශාකය
B-අණ්ඩානුධානිය තුළ රඳවා ගත් අණ්ඩ
C-දල පත්‍ර
D-විෂම බීජාණුකතාවය
E-බීජ
F-මහාපත්‍ර

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(1) B→ A → F→ D →E → C
(2)B → D → A → F → E → C
(3)A →B → D → E→ C→ F
(4)B → E → A → F → C → D
(5)B → F→A→ E→ D→ C

**13.** ආවෘත බීජක ශාකවල වර්මීය පටක පද්ධතිය පිළිබඳ නිවැරදි වන්නේ,

(1) ජලය හා ඛනිජ අවශෝෂණයට දායක වෙයි.
(2) කිසිවිටෙකත් ග්‍රන්ථි නොදරයි.
(3) ලිහිල්ව ඇසිරුණු තනි සෛල ස්තරයක් ලෙස පවතියි.
(4) සැමවිටම ජලභීතික සෛල බිත්ති දරයි.
(5) සැමවිටම ඉටිමය ස්තරයකින් වැසී පවතී.

**14.** ශාක , උත්තේජවලට දක්වන ප්‍රතිචාර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ස්පර්ශ සන්නමනයේදී *Mimosa pudica* ශාකයේ උපධානය නම් විශේෂිත චාලක ව්‍යුහයේ සෛල ශූනවීම නිසා පත්‍රිකා හැකිළෙයි.
(2) ඇතැම් ආරෝහක ශාකවල ඇති පහුරු ආධාරකයක දෙපසට එතී යන විට පහුරේ ප්‍රතිවිරුද්ධ පැතිවල සමාකාර වර්ධනයක් උත්තේජනය වේ.
(3) කඳුකර වනාන්තරවල කෙටි, මහත කඳන් සහිත ශාක තිබීම ප්‍රබල සුළංවලට ඔරොත්තු දීම සඳහා ප්‍රතිචාරයකි.
(4) සනාල ශාකවල මූලාග්‍ර කොපුවේ ඇති තුලාශ්ම ඒකරාශී වීම නිසා මුල්වල ඔක්සින ව්‍යාප්තිය අඩුකර, මුල් දික්වීම නිෂේධනය කරයි.
(5) ආවෘත බීජක ශාකවල පරාග කණිකා ප්‍රරෝහණය සහ පරාගනාලය අණ්ඩපයේ කීලය ඔස්සේ කලල කෝෂය වෙත වර්ධනය වීම ගිබෙරලින මගින් නිෂේධනය කරයි.

**15.** පහත සඳහන් K තීරුවේ ඇති සංඝටකයන්ගේ වැඩිවීම L තීරුවේ දක්වා ඇති ප්‍රතිචාරයන් වැඩි කිරීමට/ උත්තේජනය කිරීමට දායක වේද?

| | **K (සංඝටකය)** | **L(ප්‍රතිචාරය)** |
|---|---|---|
| (1) | ශාක පත්‍රවල පාලක සෛල තුළ ඇති ABA සාන්ද්‍රණය | පුටිකා සිදුර විවෘත වීම |
| (2) | බාහිර පරිසරයේ ඇති ජලවාෂ්ප සාන්ද්‍රණය | උත්ස්වේදන සීඝ්‍රතාවය |
| (3) | පෙනේර නළ ඒකක සෛල තුළ ඇති සයිටොකයිනින සාන්ද්‍රණය | අපායන පටකවලට පෝෂක චලනය |
| (4) | පත්‍රවල ඇති ඔක්සින සාන්ද්‍රණය | පත්‍ර ඡේදනය |
| (5) | මූලකේෂ සෛල යුෂයට සාපේක්ෂව පාංශු ද්‍රාවණයේ ඇති අයන සාන්ද්‍රණය | සක්‍රීය අයන අවශෝෂණය |

**16.** සන, දුර්වර්ණ වූ චර්මල පත්‍ර, විභාජක පටක මිය යාම යන ලක්ෂණ ශාකවල දක්නට ලැබෙන්නේ පහත සඳහන් කවරක් පාංශු ද්‍රාවණයේ ඌන වීමෙන්ද?

(1) $MoO_4^{2-}$
(2) $Zn^{2+}$
(3) $Ni^{2+}$
(4) $H_2BO_3^-$
(5) $Fe^{2+}$

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**17.** බීජ ප්‍රරෝහණය සහ පුෂ්ප හට ගැනීම කෙරෙහි ආලෝකයේ බලපෑම පිළිබඳව නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ කුමක් ද? කුමන ඒවාද?

A- බීජ පැළය පස මතුපිටට පැමිණි පසු බීජාධරය දික්වීම නිෂේධනය වීම ක්‍රිප්ටොක්‍රෝම් ප්‍රතිග්‍රාහක මඟින් සිදුකරයි.

B- ශාක ප්‍රරෝහවල ආලෝකය නොලැබෙන පැත්තේ සෛල දික්වීමේ වේගය වැඩිය.

C- ධූර රක්ත කිරණ බීජ ප්‍රරෝහණය උත්තේජනය කරයි.

D- ෆයිටොක්‍රෝම් ප්‍රභාප්‍රතිග්‍රාහක පුෂ්ප හට ගැනීම සඳහා බලපායි.

(1) A සහ B පමණි
(2) A, සහ C පමණි
(3) A, B සහ D පමණි
(4) B, C සහ D පමණි
(5) A, B, C සහ D සියල්ලම

**18.** සත්ත්වයින්ගේ අපිච්ඡද පටක හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?/ කුමන ඒවා ද?

A- අවයවවල බාහිර හෝ අභ්‍යන්තර නිදහස් පෘෂ්ඨ ආවරණය කරයි.
B- පටකය තුළ රුධිරවාහිනී දරයි.
C- පටකයේ සෛල ඉතා ආසන්නව ඇසිරී ඇත.

(1) A පමණි
(2) A සහ B පමණි
(3) A සහ C පමණි
(4) B සහ C පමණි
(6) A, B සහ C පමණි

**19.** මානව ආහාර ජීර්ණ පද්ධතියේ ආහාර ජීර්ණය යාමනය හා සම්බන්ධ හෝමෝන සහ එම හෝමෝනවල කෘත්‍යයන් පහත දැක්වේ.

| හෝමෝනය | කෘත්‍යය |
|---|---|
| A- ගැස්ට්‍රින් | P- පිත්තාශයෙන් පිත නිදහස් කිරීම ක්‍රියාරම්භ කරයි. |
| B- සික්‍රටින් | Q- අග්න්‍යාශයෙන් බයිකාබනේට් නිදහස් කිරීම උත්තේජනය කරයි. |
| C- කොලිසිස්ටොකයිනින් | R- ආමාශයික යුෂ නිපදවීම උත්තේජනය කරයි. |

ඉහත සඳහන් ඒවායේ නිවැරදි සංකලනය තෝරන්න.
(1) A-Q, B-P, C-R
(2) A-P, B-R, C-Q
(3) A-P, B-Q, C-R
(4) A-R, B-P, C-Q
(5) A-R, B-Q, C-P

**20.** ආහාරවල අඩංගු තන්තු පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජීර්ණය කළ නොහැකි පොලිසැකරයිඩවලින් තැනී ඇත.
(2) එළවළු හා ධාන්‍යවල සුලබව හමු නොවේ.
(3) ආහාරයේ ප්‍රමාණය අඩු කරයි.
(4) ආහාර රුචිය වැඩි කරයි.
(5) මල ප්‍රමාණය අඩු කිරීම සඳහා ජලය ආකර්ෂණය උත්තේජනය කරයි.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**21.** හිමොග්ලොබින් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ

(1) හිමොග්ලොබින් තැනී ඇත්තේ උප ඒකක තුනකිනි.
(2) හිමොග්ලොබින් අණුවක් මඟින් $O_2$ අණු හතරක් රැගෙන යා හැකිය.
(3) හිමොග්ලොබින්වල ඇති සෑම හීම් කණ්ඩායකම ෆෙරස් පරමාණු දෙකක් අඩංගු වේ.
(4) හිමොග්ලොබින්වල ඇති ෆෙරස් පරමාණු $O_2$ අණු සමඟ අප්‍රතිවර්ත්‍යව බැඳේ.
(5) හිමොග්ලොබින් ඔක්සිජන් පරිවහනයට පමණක් දායක වේ.

**22.** මානව මෛත්‍ර පද්ධතියේ කෘත්‍යයන් කිහිපයක් පහත දැක්වේ.

A- ආසෘතික තුල්‍යතාව හා අම්ල හස්ම සමතුලිතතාව පවත්වා ගැනීම.
B- මුත්‍ර තාවකාලිකව ගබඩා කිරීම.
C- අපද්‍රව්‍ය බහිස්‍රාවය කිරීමට මුත්‍රා නිපදවීම.

වෘක්ක මඟින් ඉටු කරනු ලබන්නේ ඉහත සඳහන් කුමන කෘත්‍යයද?/ කෘත්‍යයන්ද?

(1) A පමණි
(2) B පමණි
(3) A සහ B පමණි
(4) B සහ C පමණි
(5) A සහ C පමණි

**23.** මානව හෘදයේ කපාට හා ඒවා පිහිටන ස්ථාන පහතින් දැක්වේ.

| කපාට වර්ගය | පිහිටන ස්ථානය |
|---|---|
| A- ද්විතුණ්ඩ කපාටය | P- දකුණු කර්ණිකාව හා දකුණු කෝෂිකාව අතර |
| B- ත්‍රිතුණ්ඩ කපාටය | Q- පුප්ඵුසීය ධමනිය ආරම්භක ස්ථානය |
| C- අඩසඳ කපාටය | R- මහා ධමනියෙහි ආරම්භක ස්ථානය |
| | S- වම් කර්ණිකාව හා වම් කෝෂිකාව අතර |

ඉහත සඳහන් ඒවායේ නිවැරදි සංකලනය තෝරන්න.

(1) A-R, B-Q, C-P
(2) A-S, B-P, C-Q
(3) A-Q, B-R, C-S
(4) A-R, B-S, C-Q
(5) A-P, B-S, C-R

**24.** මානව දේහයේ ඇති සංවේදක ප්‍රතිග්‍රාහකවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A- ගැඹුරු සමෙහි ස්ථානගතව ඇත.
B- විශාල පීඩන වෙනස්කම්වලට සංවේදී වේ.
C- කම්පනවලට සංවේදී වේ.

ඉහත සඳහන් ලක්ෂණ සහිත සංවේදක ප්‍රතිග්‍රාහකය වන්නේ

(1) මීස්නර් දේහාණු
(2) මර්කල් මඩල
(3) නිදහස් ස්නායු අන්ත
(4) පැසිනියන් දේහාණු
(5) රෆිනි දේහාණු

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**25.** "හෝමෝනය - කෘත්‍යය" නිවැරදිව ගලපා ඇති ප්‍රතිචාරය තෝරන්න.

| හෝමෝනය | කෘත්‍යය |
|---|---|
| (1) කෝටිසෝල් | අක්මාවේ ග්ලයිකොජන් බිඳ හෙලීමේ වේගය වැඩි කරයි. |
| (2) ඇඩ්රිනලින් | මේද සෛලවලින් මේද අම්ල නිදහස් කිරීම උත්තේජනය කරයි. |
| (3) ඇල්ඩොස්ටෙරෝන් | වෘක්කීය නාලිකා වලින් $K^+$ ප්‍රතිශෝෂණය උත්තේජනය කරයි. |
| (4) කැල්සිටොනින් | අස්ථි සෛල මත ක්‍රියාකර අස්ථි බිඳහෙළා රුධිරයට කැල්සියම් නිදහස් කිරීම දිරි ගන්වයි. |
| (5) ඔක්සිටොසින් | ක්ෂීර ග්‍රන්ථිවලින් කිරි නිපදවීම උත්තේජනය කරයි. |

**26.** මානව කලල විකසනයේදී සෑදෙන කෝරියම පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ කවරක් ද?

(1) .කලලය වටා ආරක්ෂක පටලයක් ලෙස පිහිටමින් තරලය පිරි කුහරයක් සාදයි.
(2) විකසනය වන ඩිම්බකෝෂ වෙත චලනය වන මූලික ජන්මාණු සෛල ඇති කරයි
(3) ගර්භණීභාවයේදී අවශ්‍ය වන hCG නිපදවයි.
(4) මුත්‍රාශය විකසනය හා අදාළව ක්‍රියාකරයි.
(5) රුධිරය නිපදවන ප්‍රාථමික ස්ථානයක් ලෙස ක්‍රියාකරයි.

**27.** මානව අස්ථි පද්ධතියේ ඇති සන්ධි සහ ඒ එක් එක් සන්ධිය තැනීමට දායකවන අස්ථි පහත දක්වා ඇත.එම සංකලනයන් අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/ කුමන ඒවා ද?

| සන්ධිය | සන්ධිය තැනීමට දායකවන අස්ථි |
|---|---|
| A- උරහිස් සන්ධිය | අංශඵලකය සහ ප්‍රගණ්ඩාස්ථිය පමණි |
| B- වැලමිට සන්ධිය | ප්‍රගණ්ඩාස්ථිය සහ අන්වරාස්ථිය පමණි |
| C- මැණික්කටු සන්ධිය | අරාස්ථිය, අන්වරාස්ථිය සහ හස්තකූර්චෝපරි පමණි |
| D- උකුළු සන්ධිය | උකුළු අස්ථිය සහ ඌර්වස්ථිය පමණි |
| E- දණහිස් සන්ධිය | ඌර්වස්ථිය, අනුජංඝාස්ථිය සහ දණිස්කටුව පමණි |

(1) A සහ C පමණි
(2) A සහ D පමණි
(3) A, B සහ D පමණි
(4) A, D සහ E පමණි
(5) A, B, D සහ E පමණි

**28.** මිනිසාගේ ආශ්වාස - ප්‍රශ්වාස ක්‍රියාවලියේ සමස්ථිතික යාමනය පිළිබඳව පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) දර්ශීයව ආශ්වාස - ප්‍රශ්වාස ක්‍රියාවලිය යාමනය වන්නේ ඉච්ඡානුග යන්ත්‍රණයකිනි.
(2) ශ්වසන ක්‍රියාවලියේ පාලන මධ්‍යස්ථාන යුගල දෙකක් සුෂුම්නා ශීර්ෂකයේ පිහිටා ඇත.
(3) සුෂුම්නා ශීර්ෂකයේ ඇති සංවේදක මගින් මස්තිෂ්ක සුෂුම්නා තරලයේ pH අගය ඉහළ යාම හඳුනා ගනියි.
(4) රුධිරයේ $O_2$ සාන්ද්‍රණය ඉතා පහළ ගියවිට මහා ධමනියේ $O_2$ සංවේදක මගින් සුෂුම්නා ශීර්ෂකයට ආවේග ලබා දෙයි.
(5) ශ්වසන යාමනය නිසිලෙස හැසිරවීමට අදාළ ප්‍රධාන ස්නායු පරිපථ වැරෝලි සේතුවේ පිහිටයි.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**29.** පරිචිත ප්‍රතිශක්තියේදී T වසා සෛල සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) T වසා සෛල මගින් විශේෂ සෛල වන ප්‍රතිදේහජනක ඉදිරිපත් කරන සෛල හඳුනා ගනියි.
(2) තනි T වසා සෛලයක ඇති විශිෂ්ට ප්‍රතිදේහජනක ප්‍රතිග්‍රාහක සර්වසම විය නොහැකිය.
(3) T වසා සෛලයක මතුපිට ඇති ප්‍රතිදේහජනක ප්‍රතිග්‍රාහක සියල්ල එකම එපිටෝපයකට බැඳිය හැකිය.
(4) T වසා සෛල සක්‍රිය වූ විට ඒවා ප්‍රගුණනය වී මුල් සෛලයට සර්වසම නොවන දුහිතෘ සෛල ඇති වේ.
(5) T වසා සෛල ක්ලෝනවල පවතින සියලුම සෛල කාරක T සෛල බවට විභේදනය වේ.

**30.** උපත් පාලන ක්‍රම පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශන අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) උපත්පාලන කොපු භාවිතය පුරුෂයන් විසින් බහුලව භාවිත කරන තාවකාලික උපත් පාලන ක්‍රමයකි.
(2) ස්ත්‍රීන් සඳහා වූ ගිලින පෙති මගින් හයිපොතැලමසෙන් GnRH නිදහස් කිරීම උත්තේජනය කරයි.
(3) Depo-Provera එන්නත මගින් කාන්තාවන් කෘත්‍රිම ඊස්ට්‍රජන් ලබා ගනියි.
(4) IUD ලූපය කාන්තාවන් සඳහා භාවිත කරන ස්ථිර උපත් පාලන ක්‍රමයකි.
(5) පැලෝපීය නාල සැත්කම මගින් පැලෝපීය නාලයට ශුක්‍රාණු පිවිසීම වළකයි.

**31.** රතු - කොළ වර්ණාන්ධතාවයෙන් පෙළෙන පියෙකුට සහ සාමාන්‍ය පෙනීම ඇති සමයෝගී මවකට දාව උපන් ස්ත්‍රියක් සාමාන්‍ය පෙනීම ඇති පුරුෂයකු හා විවාහ වූ විට එම දෙපළගේ පළමු පිරිමි දරුවා වර්ණාන්ධ පුද්ගලයකු වීමේ සම්භාවිතාව වන්නේ

(1) 0 (2) 0.25 (3) 0.5 (4) 0.75 (5) 1

**32.** හාඩි - වයින්බර්ග් සමතුලිතතාවයේ පවතින උපකල්පිත සපුෂ්ප ශාක ගහනයක පුෂ්පවල රතු වර්ණය (R), සුදු වර්ණයට (r) ප්‍රමුඛ වේ. ගහනයෙන් 16%ක ශාක ප්‍රමාණයක් සුදු වර්ණය ඇති පුෂ්ප නිපදවයි. එම ගහනයේ ඇති විෂමයුග්මකයන්ගේ ප්‍රතිශතය කුමක් ද?

(1) 16% (2) 24% (3) 32% (4) 48% (5) 64%

**33.** ජාන විකෘති සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත කවරක් ද?

(1) DNA ප්‍රතිවලිත වීමේදී සිදුවන සුලබ දෝෂ හේතුවෙන් ඇතිවිය හැකිය.
(2) නියුක්ලියෝටයිඩ යුගලක් ආදේශය ලක්ෂ්‍ය විකෘතියකි.
(3) ආදේශය රාමු විස්ථාපිත විකෘතියකි.
(4) ජාන විකෘති රාශියක් මාරක විය හැකිය.
(5) නිවේශනය ඇතැම් විට නිහඬ විකෘතිවලට හේතුවිය හැකිය.

**34.** ප්‍රතිසංයෝජිත ප්ලාස්මිඩ වාහකයක් ප්‍රතිජීවක ප්‍රතිරෝධී ජානයක් මගින් සලකුණු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ

(1) ආගන්තුක ජානයේ ප්‍රකාශනය උත්තේජනය කිරීම.
(2) ධාරක බැක්ටීරියා වර්ණදේහයේ විකෘති ඇතිවීම වැළැක්වීම.
(3) ප්ලාස්මිඩය වාහකයා තුළ ගුණනය වීමේ වේගය වැඩි කිරීම.
(4) ධාරකයා තුළ ප්‍රතිජීවකය සංශ්ලේෂණය වීමේ වේගය වැඩි කිරීම.
(5) බැක්ටීරියා රෝපිතයේ ප්ලාස්මිඩය සාර්ථකව පරිණාමනය වූ බැක්ටීරියා ගහනය හඳුනා ගැනීම.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**35.** බියෝමය සහ ඊට අදාළ ලක්ෂණය නිවැරදිව ගලපා ඇති ප්‍රතිචාරය කුමක් ද?

| **බියෝමය** | **ලක්ෂණය** |
|---|---|
| (1) සැවානා | ගින්නට ප්‍රතිරෝධී මුල් සහිත ශාක |
| (2) කාන්තාර | කුරු වනාන්තර සහ පඳුරු |
| (3) වපරාල් | සදාහරිත පත්‍ර සහිත කාෂ්ඨීය ශාක |
| (4) සෞම්‍ය කලාපික තෘණභූමි | සිරස් ස්ථරීභවනය සහිත ශාක |
| (5) තුන්ද්‍රා | පයින්, ස්ප්‍රෑස් වැනි ශාක තිබීම |

**36.** බැක්ටීරියාවන්ගේ සෛල සැකසුම් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) තල තුනක සෛල විභාජනය වීමක් චතුෂ්ක සැකසුමේ ඇත.
(2) බැසිලස විභාජනය වන්නේ ඔවුන්ගේ කෙටි අක්ෂය හරහා පමණි.
(3) සර්පිල බැක්ටීරියා ඇතැම් විට ඍජු ආකාර හැඩයක් පෙන්වයි.
(4) ස්පයිරොකීටා ආකාරය සර්පිලාකාර,දෘඪ දේහයකින් යුක්තය.
(5) එකම තලයක සෛල විභාජනයෙන් දාම ආකාරයක සෛල සැකැස්මක් දක්නට ලැබෙන්නේ ස්ටැෆිලොකොකුස ආකාරයේය.

**37.** මිනිසාට වෛරස මඟින් වැළඳෙන රෝග පමණක් දැක්වෙන්නේ පහත කවර සංකලනයේ ද?

(1) පැපොල, රුබෙල්ලා, ජලභීතිකාව
(2) කොලරාව, හෙපටයිටිස්, ඉන්ෆ්ලුවෙන්සා
(3) AIDS, ලිංගික හර්පීස්, පිටගැස්ම
(4) මී උණ, රුබෙල්ලා, පිටගැස්ම
(5) ගොනෝරියාව, කොලරාව, ඉන්ෆ්ලුවෙන්සා

**38.** ක්ෂුද්‍ර ජීවීන් උපයෝගී කරගෙන නිපදවන ඵල කිහිපයක් සහ ඒ සඳහා වැදගත් වන ක්ෂුද්‍ර ජීවීන් පහත දැක්වේ.ඒ අතුරෙන් නිවැරදි ″ ඵලය - ක්ෂුද්‍ර ජීවියා″ සංකලනය වන්නේ කුමක් ද?

| **නිපදවන ඵලය** | **ක්ෂුද්‍ර ජීවියා** |
|---|---|
| (1) ඇමයිලේස් | *Streptomyces griseus* |
| (2) සිට්‍රික් අම්ලය | *Acetobacter* |
| (3) රයිබොෆ්ලේවින් | *Pseudomonas sp.* |
| (4) විටමින් $B_{12}$ | *Propionibacterium sp.* |
| (5) ටෙට්‍රාසයික්ලීන් | *Saccharomyces cerevisiae* |

**39.** ජීවාණුහරණය සහ ක්ෂුද්‍ර ජීවීන් පාලනය කිරීම සඳහා භාවිත කරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A- තෙත් තාපය　　　B- පටල පෙරීම
C- වියළි තාපය　　　D- පැස්ටරීකරණය

විටමින, වයින්, පිපෙට්ටු සහ ක්ෂුද්‍රජීවී රෝපණ මාධ්‍ය ජීවාණුහරණයේ දී යොදා ගන්නා ක්‍රම පිළිවෙලින් සඳහන් වන්නේ කවරක ද?

(1) D, A, C, B　　(2) D, B, C, A　　(3) B, D, C, A
(4) B, C, D, A　　(5) A, D,B, C

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**40.** ආහාර පරිරක්ෂණය පිළිබඳව පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/ කුමන ඒවාද?

A- ඉඟුරු සහ දොඩම් ලෙලි කල් තබා ගැනීමේ දී සීනි ස්ඵටිකරූපී ආකාරයෙන් යොදා ගනී.

B- අධිශීත කිරීමේ දී ආස්‍රැතික ක්‍රියාවලිය මගින් ආහාර කල්තබා ගනියි.

C- දුම් ගැසීමේදී දර දහනයෙන් පිටවන දුමෙහි ඇති ස්වාභාවික ප්‍රතිඔක්සිකාරක ආහාර පරිරක්ෂණයට වැදගත් වේ.

D- ඇඹරූ මස් පරිරක්ෂණයට කෙටි තරංග ආයාම සහිත විකිරණ යොදා ගනියි.

(1) A පමණි
(2) C පමණි
(3) A, සහ C පමණි
(4) A, C සහ D පමණි
(5) A, B, C සහ D සියල්ලම

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදි ය. කවර ප්‍රතිචාරය/ ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුවෙන් විනිශ්චය කර ගන්න.ඉන්පසු නිවැරදි අංකය තෝරන්න.**

(A), (B), (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ………………………………………………….. (1)
(A), (C), (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්…………………………………………………………(2)
(A) සහ (B) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්…………………………………………………... (3)
(C) සහ (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්………………………………………………….. (4)
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි නම්..................................(5)

| උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A), (B), (D) නිවැරදි ය. | (A), (C), (D) නිවැරදි ය. | (A), (B) නිවැරදි ය. | (C), (D) නිවැරදි ය. | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**41.** ප්ලාස්ම පටලය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ ,

(A) පොස්පොලිපිඩවල ජලකාමී හිස ඇතුළු දෙසට මුහුණලා ඇති අතර ජල භීතික වලිග පිටත දෙසට මුහුණලා පිහිටයි.

(B) පොස්පොලිපිඩ අණු චාලක නොවන බැවින් පටලයට තරලමය ස්වභාවයක් ගෙන දෙයි.

(C) පටලය තුළින් සම්පූර්ණයෙන්ම විනිවිද යන ඇතැම් ප්‍රෝටීන අණු තීර්යක් පටල ප්‍රෝටීන වේ.

(D) කොලෙස්ටරෝල් අණු පටලයට දෘඪතාවක් හා ස්ථායිතාවක් ලබා දෙයි.

(E) ලිපිඩ ද්විත්වස්තරයේ කොහෙත්ම නොගිලුන පටලයේ පෘෂ්ඨයට ඇඩිව බැඳුන ප්‍රෝටීන පර්යන්ත ප්‍රෝටීන ලෙස හැඳින්වේ.

**42.** ප්ලැටිහෙල්මින්තස් වංශයේ ලක්ෂණයක්/ලක්ෂණ වනුයේ,

(A) සංවේදී අවයව ලෙස අක්ෂි ලප පිහිටයි.

(B) ත්‍රි ප්‍රස්තරික ව්‍යාජ සීලෝමිකයන්ය.

(C) බහිස්‍රාවී අවයව ලෙස සිළු බල්බ පිහිටයි.

(D) පූර්ව ගැංග්ලියා යුගලක් හා අන්වායාම ස්නායු රැහැන් යුගලක් මධ්‍ය ස්නායු පද්ධතියට අයත්ය.

(E) බැක්ටීරියා ප්‍රතිජීවක සඳහා සංවේදී නොවේ.

**43.** පාසි ,ශුකි පාසි සහ ගදා පාසි සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(A) පාසි සහ ගදාපාසි සියල්ලම සමබීජාණුක වන අතර ශුකි පාසි විෂමබීජාණුක වේ.

(B) ශුකි පාසි සහ ගදා පාසිවල ප්‍රමුඛ ශාකය බීජාණු ශාකය වන අතර ,පාසිවල ප්‍රමුඛ ශාකය ජන්මාණු ශාකය වේ.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(C) ශුකි පාසි සහ පාසිවල ප්‍රමුඛ ශාක මූලාභ දරණ අතර ගදා පාසිවල ප්‍රමුඛ ශාක මුල් දරයි.
(D) ශුකි පාසි සහ ගදා පාසිවල විභේදනය වූ සනාල පටක දරණ අතර, පාසි විභේදනය වූ සනාල පටක නොදරයි.
(E) ශුකි පාසි සහ පාසි බොහෝ විට සිරස්ව වර්ධනය වන අතර, ගදාපාසි තිරස්ව වර්ධනය වේ

**44.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කවරකද්?/කවර ඒවාද?
(A) ඇටමිදුලු තුළම රැඳී සිටිමින් විකසනය සම්පූර්ණ කර ගන්නා වසා සෛල, B වසා සෛල වේ.
(B) පරිණතිය සඳහා තයිමසට සංක්‍රමණය වන වසා සෛල, T වසා සෛල ලෙස හැඳින්වේ.
(C) T වසා සෛල සහ B වසා සෛල දෙවර්ගයම ඇටමිදුලු තුළ පවතින ද්විතියික සෛලවලින් සම්භවය වේ.
(D) තනි ප්‍රතිදේහජනකයක තනි එපිටෝපයක් පමණක් දක්නට ලැබේ.
(E) පරිචිත ප්‍රතිශක්ති ප්‍රතිචාර හට ගැනීමට සම්පූර්ණ ප්‍රතිදේහජනකයම හේතු වේ.

**45.** ශ්වසන වර්ණක සම්බන්ධ සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ කුමක්ද / කුමන ඒවා ද?

(A) හිමොග්ලොබින් මිනිස් රුධිරයේ සහ ආත්‍රපෝඩාවන්ගේ දැකගත හැකිය.
(B) හිමොසයනින් ආත්‍රපෝඩාවන්ගේ පමණක් දැකිය හැකි වේ.
(C) ක්ලෝරොක්රුවොරින් බොහෝ ඇනෙලිඩාවන්ගේ රුධිරයේ ඇත.
(D) රුධිරයේ අඩංගු නොවන වර්ණකය මයොග්ලොබින් වේ.
(E) හිමොඑරිත්‍රින් සාගර පෘෂ්ඨවංශිකයන්ගේ දැකිය හැකිය.

**46.** මෙන්ඩලීය නොවන ආවේණික රටා සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත කවරක් ද? කවර ඒවාද?
(A) අසම්පූර්ණ ප්‍රමුඛතාවයේ දී $F_2$ පරම්පරාවේ රූපාණුදර්ශ අනුපාතය, ප්‍රවේණිදර්ශ අනුපාතයට සමාන නොවේ.
(B) විෂමයුග්මක අවස්ථාවේ දී රූපාණුදර්ශය ප්‍රකාශ කිරීමට ඇලීල දෙකම සමානව දායකවීම සහප්‍රමුඛතාව ලෙස හැඳින්වේ.
(C) මානව AB රුධිර ගණය බහු ඇලීලතාවට නිදසුනකි.
(D) බහුජාන ලක්ෂණයකට අදාළව ගහනයක් නිරූපනය කරන දත්ත ප්‍රමත ව්‍යාප්තියක් පෙන්වයි.
(E) අභිභවනයේ දී එක් පථයක ඇති ජානයක රූපාණුදර්ශීය ප්‍රකාශනය වෙනස් පථයක ඇති තවත් ජානයක මැදිහත්වීම හේතුවෙන් වෙනස් වේ.

**47.** ප්‍රවේණිකව විකරණය කරන ලද ජීවීන් හා ඔවුන්ගේ භාවිත (GMOs) පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න.
(A) ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ඔවුන්ට අතිරේක ගති ලක්ෂණ හඳුන්වා දී ඇත.
(B) මෙම ජීවීන්ගෙන් ලබා ගන්නා ආහාර ප්‍රවේණිකව විකරණය කරන ලද ආහාර (GMF) නම් වේ.
(C) භෝග අස්වැන්න වැඩි කිරීමට මෙම ජීවීන්ගෙන් වැදගත් දායකත්වයක් නොලැබේ.
(D) වර්තමානයේ rDNA තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස මෙම ජීවීන් බිහි කරයි.
(E) විටමින් A වලින් පොහොසත් රන් සහල් මෙම ජීවීන්ගේ භාවිත අවස්ථාවකි.

**48.** ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ව්‍යාප්තව පවතින වනාන්තරවලට අදාළ ලක්ෂණ සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක්ද? /කුමන ඒවා ද?

(A) ඇතැම් වනාන්තර උන්නතාංශය 900mට අඩු ප්‍රදේශවල ව්‍යාප්තව ඇත.
(B) සමහර වනාන්තරවල මීටර 15ක් පමණවන මිටි වියනකින් සමන්විතය.
(C) මධ්‍යනාය වාර්ෂික වර්ෂාපතනය කිසිදු නියං කාලයක් රහිතව 2000mm- 5000mm අතර විචලනය වේ.
(D) කුඩ හැඩ රවුම් වූ මස්තක දරණ ශාක ඇත.
(E) වෘක්ෂලතාදිය කාෂ්ඨාරෝහක ජාලයකින් සමන්විත අතර ඒවා වියන් ස්ථරය කරා ළඟා නොවේ.

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

**49.** අන්තඃධූලක නිපදවන බැක්ටීරියාවන් වන්නේ,

(A) *Salmonella typhi*
(B) *Bacillus thuringiensis*
(C) *Clostridium tetani*
(D) *Vibrio cholerae*
(E) *Escherichia coli*

**50.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් බරවා රෝගය සම්බන්ධව නිවැරදි වන්නේ කුමක්ද?/ කුමනඒවාද?,

(A) නොසලකා හරිනු ලබන සර්ම කලාපික රෝගයකි.
(B) ලෝකයේ පැරණිම බෙලහීන කරවන රෝග වලින් එකකි.
(C) මිනිසාගේ වසා පද්ධතියේ ජීවත්වන බැක්ටීරියාවක් මඟින් සෑදෙයි.
(D) සායනිකව රෝග ලක්ෂණ, කිසිඳු රෝග ලක්ෂණයක් නොපෙන්වීමේ සිට නිදන්ගත Lymphedema දක්වා වෙනස් විය හැකිය.
(E) වෘෂණවල වසා තරලය එකතුවීම hydrocele ලෙස හඳුන්වයි.

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය- **2026** උපකාරක තක්සේරුව
General Certificate of Education (Adv. Level) Exam-**2026 Supportive Assessment**

**ජීව විද්‍යාව II**
**Biology II**

**09 S II**

**13 ශ්‍රේණිය**
**Grade 13**

පැය තුනයි
*Three hours*

අමතර කියවීම් කාලය – මිනිත්තු **10** යි
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස් :

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 10 කින් සහ ප්‍රශ්න **10**කින් සමන්විත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් **කොටස් දෙකකින්** සමන්විත වන අතර **කොටස් දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A** කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක **2-13)**

* ප්‍රශ්න හතරට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේම ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය.මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නො වන බව ද සලකන්න.

**B** කොටස - රචනා (පිටු අංක **14)**

* ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| **A** | **1** | |
| | **2** | |
| | **3** | |
| | **4** | |
| **B** | **5** | |
| | **6** | |
| | **7** | |
| | **8** | |
| | **9** | |
| | **10** | |
| එකතුව | | |

එකතුව

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

මෙම තීරයේ කිසිවක් නොලියන්න.

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **100** කි.)

1. (A) (i) "ප්‍රාක් සෛලය" බිහිවීමේදී මුල්ම එන්සයිම ලෙස ක්‍රියා කළ මහා අණු වර්ගය කුමක් ද?

.............................................................................................................

(ii) (a) "සහඑන්සයිමයක්" යනු කුමක්ද?

.............................................................................................................

.............................................................................................................

(b) ශාක සෛලයක හරිතලව තුළ හමුවන සහඑන්සයිමයක් මෙන්ම ඉලෙක්ට්‍රෝන වාහකයක් ලෙස ද ක්‍රියාකරන නියුක්ලියෝටයිඩයක් නම් කරන්න.

.............................................................................................................

(iii) සෛලයක් තුළ එන්සයිම යාමනයේ ඇලොස්ටරික යන්ත්‍රණයේ "සහයෝගීතාව" යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(iv) (a) ඩේලියා ආකන්දවල ශක්ති ප්‍රභවයක් ලෙස භාවිත වන ප්‍රධාන සංචිත පොලිසැකරයිඩයක් නම් කරන්න.

.............................................................................................................

(b)ඉහත (iv) (a) හි සඳහන් කළ පොලිසැකරයිඩයේ මූලික තැනුම් ඒකකය නම් කර එහි අඩංගු කාබන් පරමාණු සංඛ්‍යාව සඳයන් කරන්න.

- තැනුම් ඒකකය - .............................................................................
- කාබන් පරමාණු සංඛ්‍යාව - .............................................................................

(c) ඉහත (iv) (b)හි ඔබ හඳුනාගත් මූලික තැනුම් ඒකකය ජලීය මාධ්‍යයකදී හඳුනාගැනීම සඳහා විද්‍යාගාරයේදී භාවිත කළ හැකි ප්‍රතිකාරකයක් නම් කරන්න.

.............................................................................................................

( B) (i) ප්‍රාග්න්‍යෂ්ටිකයන්ගේ කශිකා සහ සුන්‍යෂ්ටිකයන්ගේ කශිකා අතර ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

| ප්‍රාග්න්‍යෂ්ටික කශිකා | සුන්‍යෂ්ටික කශිකා |
|---|---|
| 1. ............................................ | ............................................ |
| 2. ............................................ | ............................................ |
| 3. ............................................ | ............................................ |

(ii) (a) බොහොමයක් සත්ත්ව සෛලවල බහිෂ්සෛලීය පූරකයේ දක්නට ලැබෙන වඩාත් සුලබ ග්ලයිකොප්‍රෝටීනය කුමක්ද?

.............................................................................................................



AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(b) ඔබ ඉහත B (ii) (a) හි සඳහන් කළ ග්ලයිකොප්‍රෝටීනය සත්ත්ව සෛලයක බහිෂ්සෛලීය පූරකය තුළ සකස් වී ඇත්තේ කෙසේ ද?

.........................................................................................................................

.........................................................................................................................

(c) සත්ත්ව සෛලයක බහිෂ්සෛලීය පූරකයේ කාර්යයන් තුනක් සඳහන් කරන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(d) සත්ත්ව සෛල තුළ අන්තර් සෛලීය අවකාශ තුළින් බහිෂ්සෛලීය තරලය කාන්දුවීම වළක්වන සෛල සන්ධි වර්ගය කුමක්ද?

.........................................................................................................................

(iii) (a) සත්ත්ව සෛලයක සෛල විභාජනයේදී සෑදෙන තර්කු උපකරණයට අයත් කොටස් මොනවාද?

.........................................................................................................................

(b) ඌනනයේ II වියෝග කලාව II හිදී සිදුවන ප්‍රධාන සංසිද්ධීන් දෙකක් සඳහන් කර, ඒවා සිදුවීමට බලපාන ප්‍රධාන හේතුවක් බැගින් දක්වන්න.

| සංසිද්ධිය | හේතුව |
|---|---|
| 1…........................................................ | ............................................................ |
| ............................................................ | ............................................................ |
| 2…........................................................ | ............................................................ |
| ............................................................ | ............................................................ |

(iv) (a) මිනිසාගේ හෘත් පේශි සෛලයක් මත එක් ග්ලූකෝස් අණුවක් ස්වායු ශ්වසනයට භාජනය වීමෙන් නිපදවෙන සම්පූර්ණ ATP අණු සංඛ්‍යාව කොපමණද?

.........................................................................................................................

(b) මිනිසාගේ හෘත් පේශි සෛල එකිනෙක සම්බන්ධ කරන අන්තරස්ථාපිත මඩල් අතර බහුලව දැකගත හැකි සෛල සන්ධි වර්ගය කුමක්ද?

.........................................................................................................................

(C) (i) රතු ඇල්ගාවන්ට සමාන දැනට හමුවන පැරණිම ප්‍රෝටිස්ටාවන්ගේ ෆොසිල වසර බිලියන කීයක් පමණ පැරණිද?

.........................................................................................................................

(ii) පරාග කණිකාවල සනකම් බිත්තියේ ඇති ප්‍රධාන බහුඅවයවිකය නම් කරන්න

.........................................................................................................................



AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(iii) පහත සඳහන් එක් එක් ලක්ෂණය දක්නට ලැබෙන සත්ත්ව වංශයක් බැගින් නම් කරන්න.

